# මණිඅක්ඛික නාරජුගේ ප්‍රතිමාවක් අද කැලණිය දුරුතු මහ පෙරහරට



කැලණිය රජ මහා විහාරය වාර්ෂිකව පවත්වන දුරුතු පින්කම් මාලාවේ අවසන් රන්දෝලි පෙරහර අද 30 වැනිදා රාත්‍රියේ වීදි සංචාරය කෙරේ. හෙලේනා විජයවර්ධන මාතාවගේ පුත් දොන් වෝල්ටර් විජයවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් 1927 වර්ෂයේ සිට පෙරහර ආරම්භ කරන ලද බව ඉතිහාසයෙහි සඳහන්ය. කැලණියට වැඩම කරන ලෙස ගෞතම බුදුරජාණන් වහන්සේ වෙත කරන ලද ඇරයුමට කෘතවේදීත්වය පළ කරමින් මණිඅක්ඛික නා රජුගේ ප්‍රතිමාවක් මෙවර කැලණිය දුරුතු මහ පෙරහරට නවාංගයක් වශයෙන් එකතු වෙයි.

විහාරාධිපති මහාචාර්ය කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත නාහිමිපාණන් ප්‍රමුඛ විහාරස්ථ දායක සභාව චිත්‍ර ශිල්පී සෝලියස් මැන්දිස් මහතාගේ නිර්මාණයක් ඇසුරු කරගනිමින් තායිලන්තයේ දී නිර්මාණය කර මෙරටට ගෙන එන ලද මණිඅක්ඛික නා රජ ප්‍රතිමාව කැලණිය රජමහා විහාරස්ථානය දක්වා එම්.එම්.බී.එල්. පාත්ෆයින්ඩර් සමාගම් පරිශ්‍රයට අයත් තොටුපොළේ සිට කැලණි ගඟ ඔස්සේ යාත්‍රා පෙරහරකින් ප්‍රවේශ කරවීම පසුගියදා සිදුවිය.

සමාගමේ සභාපති මිලින්ද මොරගොඩ මහතා සහ විහාරාධිපති මහාචාර්ය කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත නාහිමිපාණන් එය වෙනුවෙන් ශිලා ලේඛනයක් ප්‍රතිශ්ඨාපනය කරන ලද අතර ප්‍රතිමාව වාර්ෂිකව දුරුතු මහා පෙරහර සඳහා ඇතුළත් කරන බව නායක හිමිපාණෝ නිවේදනය කරති.